සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** | **කතෝලික ධර්මය I** | **කාලය පැය 1 යි**

නම/ විභාග අංකයඃ

- 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරා ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ අංකයට ගැලපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

---

01. ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුමේ ඉතිහාස පොත් හඳුන්වන්නේ,
    (1) දේව වේදීය ඉතිහාස කතා ලෙස ය. (2) දේව වේදීය භූගෝලීය කතා ලෙස ය.
    (3) දේව වේදීය සංස්කෘතික කතා ලෙස ය. (4) දේව වේදීය සමාජයීය කතා ලෙස ය.

02. හෙළිදරව් සාහිත්‍යයේ 'මකරා' මගින් සංකේතවත් වන්නේ,
    (1) පීඩාකාරී බලවේග ය. (2) තෘප්තිමත් බලවේග ය.
    (3) ලෞකික බලවේග ය. (4) අයහපතේ බලවේග ය.

03. ශුද්ධ බයිබලයේ අනාවරණ සාහිත්‍යයේ වර්ණ සංකේත කීපයක් පහත දක්වේ.

    A - කොළ B - සුදු C - කළු D - රතු E - සුදුමැලි

    මේවායින් මරණය හා සාගතය සංකේතවත් කරන වර්ණ සංකේත වන්නේ,
    (1) A හා E ය. (2) C හා D ය. (3) B හා C ය. (4) C හා E ය.

04. විප්‍රවාසයෙන් පසු ජුදා ජාතියේ සාමාජීය හා ආගමික ප්‍රතිස්ථාපනය පිළිබඳ කරුණු ඇතුලත් වන්නේ,
    (1) අපෝස්තුළුවරයන්ගේ ක්‍රියා පොතෙහි ය. (2) එස්රා හා නෙහෙමියා පොත්වල ය.
    (3) තිමති හා පිලමොන් පොත්වල ය. (4) සුභාරංචි පොත්වල ය.

05. සුපුවත් සතරේම සඳහන් වන එකම ප්‍රතිහාර්යය වනුයේ,
    (1) පූප වැඩි කිරීමේ ප්‍රතිහාර්යයි. (2) කානා නුවර ප්‍රතිහාර්යයි.
    (3) මාරුත දමනය ප්‍රතිහාර්යයි. (4) ජාත්‍යාන්ධයා සුවකිරීමේ ප්‍රතිහාර්යයි.

06. මහ බ්‍රහස්පතින්දා දින දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ස්ථාපිත කිරීමේ සිද්ධිය සඳහන් කරන සුපුවත් කතුවරුන් වනුයේ,
    (1) මතෙව්, මාක්, ලූක් ය. (2) මාක්, ලූක්, ජොහාන් ය.
    (3) මතෙව්, ලූක්, ජොහාන් ය. (4) මතෙව්, මාක්, ජොහාන් ය.

07. ක්‍රිස්තුන් වහන්සේ තුළ පාපයට මැරී නව ජීවිතයකට උත්ථාන වෙමින් කල්වාරි යාගයට සම්බන්ධ විය හැක්කේ,
    (1) ප්‍රසාද ස්නාපනයෙනි. (2) දිව්‍ය සත්ප්‍රසාදයෙනි.
    (3) පාපොච්චාරණයෙනි. (4) අභිවෘද්ධි ආලේපනයෙනි.

08. ''මම පූජා වලට වඩා කරුණාවට කැමැත්තෙමි. දවන යාග පූජා වලට වඩා දෙවියන් වහන්සේ පිළිබඳව අවබෝධයට කැමැත්තෙමි.'' මෙසේ සඳහන් වන දිවැසිවර ග්‍රන්ථය කුමක් ද?
    (1) යෙසායා (2) ජෙරමියා (3) එසකියෙල් (4) හොසියා

09. ''නුඹේ පියාට ද මවට ද..... කරව. එවිට නුඹේ දෙවි ස්වාමීන් වහන්සේ නුඹට දෙන රටේ නුඹ බොහෝ කාලයක්...... වන්නේ ය.'' මෙම ප්‍රකාශයේ හිස්තැන්වලට සුදුසු වචන පිළිවෙලින් නිවැරදිව දක්වෙන වරණය තෝරන්න.

(1) ගෞරව, ජීවත් (2) ගෞරව, සතුට (3) ප්‍රිය, ජීවත් (4) ස්තුති, සතුට

10. උත්පත්ති 1 : 26 28 ට අනුව දෙවියන් වහන්සේ විසින් මිනිසා මවා ඇත්තේ,

(1) දේව ස්වරූපයට හා සමානකමට ය.

(2) දේව ස්වරූපයට හා අමරණීයත්වයට ය.

(3) දේව ස්වරූපයට හා නිදහස් කැමැත්තට ය.

(4) දේව ස්වරූපයට හා මනුෂ්‍ය ස්වභාවයට ය.

11. ලෝක ආරම්භයේ සිටම ජන්ම පාපය ක්‍රියාත්මක වූ බවට නිදසුනකි,

(1) කායින් ආබෙල් සිද්ධිය. (2) ජාකොබ් ඒසව් සිද්ධිය.

(3) ආබ්‍රහම් ඒසව් සිද්ධිය. (4) මෝසෙස් ආරොන් සිද්ධිය.

12. මයර්‍යාදාවය නැමති යහගුණය උපදින ප්‍රධාන ධර්ම ගුණය වන්නේ,

(1) හික්මවීමයි. (2) දයාවයි. (3) කරුණාවයි. (4) සමාව දීමයි.

13. ජේසුස් වහන්සේ සකේවුස්ට සමාව දුන්නේ,

(1) ක්‍රිස්තුස් වහන්සේ ඔහුව පිළිගත් නිසාය.

(2) අයුතු ලෙස ලබා ගත් දේ නැවත දීම නිසාය.

(3) ක්‍රිස්තුන් වහන්සේ ඔහුගේ නිවසට ගිය නිසාය.

(4) සකේවුස්ගේ හොඳ හිත දිනා ගැනීම සඳහාය.

14. කතෝලික සභා ධර්මෝපදේශයට අනුව දිළිඳුන්ට දක්වන ආදරය ශුද්ධ වූ සභාවේ,

(1) පෞරාණික ලක්‍ෂණයකි. (2) පාරම්පරික ලක්‍ෂණයකි.

(3) ඓතිහාසික ලක්‍ෂණයකි. (4) සංස්කෘතික ලක්‍ෂණයකි.

15. ''ජානක සත්‍ය තුළ නිතරම ජීවත්වන සිසුවෙකි.'' එමඟින් අපට පෙන්වා දෙනු ලබන්නේ,

(1) සමාජයට යහපත් පුරවැසියෙකු විය යුතු බවයි.

(2) අපගේ අදහස් වලට ගරු කළ යුතු බවයි.

(3) අපගේ හෘද සාක්ෂියට අවනත විය යුතු බවයි.

(4) නිදහස් කැමැත්තට අවනත විය යුතු බවයි.

16. සත්‍යට සාක්ෂි දරමින් විශ්වාසවන්තව ජීවත් වී මරණයට පත් වූ අයව හඳුන්වනු ලබන්නේ,

(1) වීරවරු ලෙස ය. (2) ප්‍රභුවරු ලෙස ය.

(3) දේශප්‍රේමීන් ලෙස ය. (4) ප්‍රාණ පරිත්‍යාගිවරු ලෙස ය.

17. ''ලිටූජීයා'' යනු,

(1) දෙවියන්ට කරන වන්දනාවකි. (2) මරිය බැතියකි.

(3) සාන්තුවර බැතියකි. (4) රූප වන්දනාවකි.

18. ජනවන්දනාවේ ප්‍රධාන අංග තුන වන්නේ,

(1) දිව්‍ය සත්ප්‍රසාද වන්දනාව, දිව්‍ය පූජාව හා ප්‍රසාද නිධාන ය.

(2) යාම යැදුම, ප්‍රසාද නිධාන හා භක්ති අභ්‍යාස ය.

(3) දිව්‍ය පූජාව, ප්‍රසාද නිධාන හා යාම යැදුම ය.

(4) දිව්‍ය පූජාව, යාම යැදුම හා යාච්ඤාව ය.

19. දිව්‍ය පූජාවකදී සාමය පැතීමෙන් අප එකිනෙකා ප්‍රාර්ථනා කරන්නේ,

(1) අප උරුමකරගත් දේව වරප්‍රසාදයයි. (2) ජනවන්දනාවෙන් ලැබෙන දේව මහිමයයි.

(3) මනස්ථාපයෙන් උරුම වන ශාන්තියයි. (4) ක්‍රිස්තු උත්ථානයේ බලමහිමයේ සාමයයි.

20. ජීවිතයේ සෑම අවස්ථාවකදීම යාච්ඤාවෙන් සූදානම් විය යුතු බව අපට පෙන්වා දෙන්නේ,

(1) උත්තම පූජක යාච්ඤාව තුළිනි.
(2) කල්වාරි යාගය තුළිනි.
(3) මල් උයනේ යාච්ඤාව තුළිනි.
(4) ස්වාමිවාක් ආරාධනාව තුළිනි.

21. පුරාණ ගිවිසුමෙහි ජන වන්දනාවට අදාල නීති නියෝග සඳහන් වන්නේ,

(1) ගීතාවලියේ ය.
(2) එළිදරව්වේ ය.
(3) උත්පත්ති පොතේය.
(4) ලෙවී ව්‍යවස්ථාවේ ය.

22. ක්‍රිස්තියානි බයිබලයේ පුරාණ ගිවිසුමේ පොත් සංඛ්‍යාවට සමාන පොත් සංඛ්‍යාවක් (පොත් 39) ඇති බයිබලය වන්නේ,

(1) ග්‍රීක බයිබලයයි.
(2) ලතින් බයිබලයයි.
(3) හෙබ්‍රෙව් බයිබලයයි.
(4) සෙප්ටුවාජින්ත බයිබලයයි.

23. යාවේ දෙවියන් වහන්සේ වෙනුවෙන් කතා කරන්නා හඳුන්වන ග්‍රීක වචනය කුමක්ද?

(1) නබී
(2) ප්‍රොපේටේස්
(3) මතෙටේස්
(4) ෂාලොම්

24. ඉතා ගැඹුරු දේව ධාර්මික සංකල්ප සඳහන් සුපුවත වන්නේ,

(1) ශුද්ධ වූ මතෙව් ය.
(2) ශුද්ධ වූ මාක් ය.
(3) ශුද්ධ වූ ලූක් ය.
(4) ශුද්ධ වූ ජොහාන් ය.

25. ''නුඹේ සහෝදරයා කොහේද?'' දෙවියන් වහන්සේ ඇසූ ප්‍රශ්නයට කායින් දුන් පිළිතුර වන්නේ,

(1) ඔබ ඔහු ගැන සොයන්නේ මන්ද?
(2) ඔබ මෙතරම් කිපී දුර්මුඛ වී සිටින්නේ මන්ද?
(3) මම මාගේ සහෝදරයාගේ භාරකරු ද?
(4) මාගේ සහෝදරයා සැඟවී ඇත.

26. මැවීමේ කතාවට අනුව අත්තික්කා කොළ අතු හැඳ සිටි මිනිසාට හම් වස්ත්‍ර සාදා දීමෙන් සංකේතවත් කරන්නේ. දෙවියන් වහන්සේගේ,

(1) නිර්මාණශීලී බවයි.
(2) කරුණාව, ආදරය හා රැකවරණයයි.
(3) යථාර්ථය අවබෝධ කරගත හැකි බවයි.
(4) දෙවියන් වහන්සේට සෑම දෙයක්ම කළ හැකි බවයි.

27. දෙවියන් වහන්සේ ආබ්‍රහම් කැඳවූ අවස්ථාවේ දුන් පොරොන්දුව සඳහන් වරණය තෝරන්න.

(1) ''මම නුඹට බොහෝ කල් ජීවත් වීමේ ආශිර්වාදය ලබා දෙන්නේ ය.''
(2) ''මම නුඹ මගින් විශාල ජාතියක් ඇති කරන්නේ ය.''
(3) 'මම නුඹ තම රටේ ජනප්‍රියත්වයට පත් කරන්නේ ය.''
(4) 'මම නුඹ මගින් පෙළපත් නාමයක් ඇති කරන්නේ ය.''

28. ශුද්ධ බයිබලයේ උත්පත්ති පොතට අනුව මුල්ම ගිවිසුම ඇති කරගන්නේ,

(1) ජාකොබ් සහ ඒසව් සමඟ ය.
(2) කායින් සහ ආබෙල් සමඟ ය.
(3) ආදි මව් පියන් සමඟ ය.
(4) ආබ්‍රහම් සහ ඊසාක් සමඟ ය.

29. මහළු දෙමාපියන්ට දාව ස්නාවක ජොහාන් තුමාගේ උපත සිදුවීම තුළින් පිළිබිඹු වන්නේ,

(1) දෙවියන් වහන්සේට මහත් දේ කළ හැකි බවයි.
(2) දෙවියන් වහන්සේ ඇදහිල්ලේ පරිපූරකයාණන් වන බවයි.
(3) දෙවියන් වහන්සේට සියල්ල කළ හැකි බවයි.
(4) දෙවියන් වහන්සේ සියල්ලට ඉහළින් වැඩ වසන බවයි.

30. ශ්‍රාවකයන් 70 දෙනාගේ ධර්ම දූත මෙහෙය මගින් සංකේතවත් කරනුයේ,

(1) චර්මඡේදිතයන්ට ස්වර්ග රාජ්‍ය හිමි වන බවයි.

(2) ජුදා ජනතාවට පමණක් ගැලවීම උරුම වන බවයි.

(3) සුභාරංචිය නොදන්නා සියලු ජනතාවට සුභාරංචිය රැගෙන යාමයි.

(4) තෝරාගත් ජනතාව ගෝලයින් කිරීමයි.

31. යුක්තිය උදෙසා පීඩා විඳින්නෝ භාග්‍යවන්තයෝය......... හිස්තැනට සුදුසු වගන්තිය තෝරන්න.

(1) ඔව්හු තෘප්තිමත් වන්නෝය.

(2) ස්වර්ග රාජ්‍ය ඔවුන්ගේ ය.

(3) ඔව්හු දෙවියන් වහන්සේ දකින්නෝ ය.

(4) ඔව්හු දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන්නේය.

32. ප්‍රසාද ස්නාපනයේ ප්‍රධාන හා අනිවාර්ය සංකේතය වන්නේ,

(1) ආත්මයාණන් වහන්සේ ය. (2) ජලය ය.

(3) පාස්කු ඉටි පහන ය. (4) ගින්දර ය.

33. සුවය දානය කිරීමේ ප්‍රසාද නිධානයක් වන්නේ,

(1) ප්‍රසාද ස්නාපනය යි. (2) රෝගීන්ගේ ආලේපය යි.

(3) දිව්‍ය සත්ප්‍රසාදය යි. (4) පූජකවරය යි.

34. පූජකවරයේ පූර්ණත්වය හිමි වන්නේ,

(1) කාදිනල් ධූරය ටය. (2) පූජකවරුන්ටය.

(3) රාජගුරු ප්‍රසාදී ධූරය ටය. (4) අපෝස්තුලුවරුන්ටය.

35. ශිෂ්‍ය ව්‍යාපාරයේ ආදර්ශ පාඨය වන්නේ කුමක් ද?

(1) ආදර්ශවත්, ශුද්ධවත් ජීවිත ගත කරමු.

(2) අපි විප්ලව නො කරමු; විප්ලවය අපිම වෙමු.

(3) සුභාරංචිය ගෙන යමින් ධර්මදානයේ නියලෙමු.

(4) සබකෝලය දුරලමින් ඉදිරිපත් වීමේ හැකියාව වර්ධනය කරමු.

36. ශුද්ධ බයිබලයෙ මතෙව් සුවිශේෂය 5:22 පාඨයෙහි සඳහන් ආකාරයට තම සොයුරාට ''ජඩයා'' යයි ගරහන්නා ඇතුළත් වනුයේ,

(1) ශ්‍රේෂ්ඨාධිකරණයටය. (2) අධිකරණයටය. (3) නිරාගින්නටය. (4) පොලීසියටය.

37. ''සැබැවින්ම මම ඔබට කියමි. මොවුන්ගෙන් ඉතාම සුළු තැනැත්තාට වුවද එසේ නොකළානම් එය නො කළේ මටය.'' මෙසේ වදාරණ ලද්දේ කවුරුන් ද?

(1) දෙව්පියාණන් වහන්සේ ය. (2) ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය.

(3) යෙසායා දිවැසිවරයා ය. (4) ජුවාම් තුමා ය.

38. ශුද්ධ වූ සභා විනය හා සෙසු කාරණා පිළිබඳ නීති රීති අඩංගු වන්නේ,

(1) ජීවන සභා සම්ප්‍රදායේය. (2) ද්විතීය නීති සංග්‍රහයේය.

(3) කතෝලික සභා ධර්මෝපදේශයේය. (4) සභා නීති සංග්‍රහයේය.

39. දෙව් මිනිස් සංවාදය සඳහා කිතු සමිඳුන් අපට පූර්වාදර්ශයක් ලබාදුන්නේ,

(1) තුන්කාල ආරාධනාවෙනි. (2) උදය ආරාධනාවෙනි.

(3) රාත්‍රී ආරාධනාවෙනි. (4) ස්වාමිවාක් ආරාධනාවෙනි.

40. දෙවන වතිකාන මන්ත්‍රණ සභාවට පෙර යාම යැදුම හැඳින්වූයේ,

(1) දිව්‍ය පූජාව යනුවෙනි. (2) ජනවන්දනාව යනුවෙනි.

(3) දේවකාරිය යනුවෙනි. (4) වෙස්පස් යනුවෙනි.

The National e-Learning Portal for The General Education

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** | **කතෝලික ධර්මය II** | **කාලය පැය 2 යි**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) (i) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙහි සැකැස්මෙහි අන්තර්ගත කරුණු දෙකක් නම් කරන්න.

(ii) පෘතුගීසි සමයේ මෙරටට සේවය සඳහා පැමිණි පැවිදි නිකායන් දෙකක් සඳහන් කරන්න.

(iii) පුරාණ ගිවිසුමේ යාග පැවැත්මේ පරමාර්ථ දෙකක් ලියන්න.

(iv) නිර්මල සිතකින් යුතුව පිවිතුරු දිවියක් ගත කිරීමට අපට මඟ පෙන්වන පනත් දෙක ලියන්න.

(v) පුදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් අනු කොටස් දෙක නම් කරන්න.

(vi) ලූක් සුපුවත හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

(vii) දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමඟ ඇතිකරගත් ගිවිසුවේ ප්‍රධාන කරුණු දෙකක් ලියන්න.

(viii) කිතුණු විවාහයේ ලක්ෂණ දෙකක් ලියන්න.

(ix). මැවීම පිළිබඳ දෙවන කථාවට අනුව දෙවියන් වහන්සේ මිනිසාට පැවරූ වගකීම් දෙකක් ලියන්න.

(x). කල්කටාවේ ශුද්ධ වූ තෙරේසා මව්තුමිය භාග්‍යවරයට හා ශුද්ධවරයට එසවූ ශුද්ධෝත්තම පියවරුන් දෙපළ නම් කරන්න.

(ලකුණු 02 × 10 = 20)

(02) (i) ශුද්ධ වූ සතියේ ප්‍රධාන ජනවන්දනා දිනයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) උත්තම පූජක යැදුමේ ප්‍රධාන කොටස් තුන නම් කරන්න. (ලකුණු 03)

(iii) පරිණත කිතුණුවෙකු ලෙස ඔබ මීසම තුළ ජනවන්දනා මෙහෙයන් අර්ථවත්ව කර ගැනීමට කළ හැකි යෝජනා පහක් ලියන්න. (ලකුණු 05)

(03) (i) උත්ථානයෙන් පසුව ක්‍රිස්තුන් වහන්සේ තම ශ්‍රාවකයින්ට දර්ශණය වූ අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ජාකොමේ ගොන්සාල්වෙස් පියතුමා ශ්‍රී ලංකාවේ කිතුණු සභාවට දායාද කළ සාහිත්‍යය කෘති තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) පාසල් සිසුවෙකු / සිසුවියක ලෙස කිතුණු විශ්වාසය වෙනුවෙන් ඔබ සාක්ෂි දැරූ අවස්ථා පහක් ලියන්න. (ලකුණු 05)

The National e-learning Portal for The General Education

(04) (i) දෙවියන් වහන්සේ විසින් කායින්ට දුන් දඬුවම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ක්‍රිස්තුන් වහන්සේ තම දූත කාර්යය ආරම්භයේ දී මුහුණ දුන් අභියෝග තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) දේව වචනයට අනුව දිවි ගෙවීමට ඔබට වපුරන්නාගේ උපමාවෙන් ගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05)

(05) (i) පදවි පූජාප්‍රසාදිවරු තම පූජක දිවිය තුළ ගන්නා පොරොන්දු දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ආත්මික මවක හෝ පියෙකු වීමට සපුරා ගත යුතු සුදුසුකම් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) නව යොවුන් වියේ පසුවන තරුණ දූ පුතුන්ට තම ජීවිත අභියෝග ජය ගැනීමට තරුණ ක්‍රිස්තියානි ශිෂ්‍ය ව්‍යාපාරයෙන් ලැබෙන අත්වැල කෙබඳු දැයි විග්‍රහ කරන්න. (ලකුණු 05)

(06) (i) දේව දරුවන් ලෙස ජීවත් වීමට අපට මඟ පෙන්වන ශුද්ධවූ සභාවේ ශික්ෂා පද දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) විවිධ අවස්ථාවල දී විවිධ පුද්ගලයින්ට මරියතුමී දර්ශනය වූ අවස්ථා තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) ''අපට වැරදි කරන අයගේ වැරදි අප කමා කරන්නාක් මෙන් අපගේ වැරදිද කමා කළ මැනව.'' මේ සඳහා ඔබ ජීවිතයෙන් ලද අත්දැකීම් පහක් විස්තර කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) ශුද්ධ බයිබලයේ සෙප්ටුවාජින්ත පිටපත

(ii) දයාවේ වසර තුළ අභිෂේක ලත් දයාවේ දූතිකාව

(iii) කතෝලික දහම්පාසල

(iv) අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා (ලකුණු 5 x 2 = 10)

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. ( 1 ) | 02. ( 1 ) | 03. ( 4) | 04. ( 2 ) | 05. ( 1 ) | 06. ( 1 ) | 07. ( 3 ) | 08. ( 4 ) | 09. ( 1 ) | 10. ( 1 ) |
| 11. ( 1 ) | 12. ( 1 ) | 13. ( 2) | 14. ( 2 ) | 15. ( 3 ) | 16. ( 4 ) | 17. ( 1 ) | 18. ( 3 ) | 19. ( 4 ) | 20. ( 3 ) |
| 21. ( 4 ) | 22. ( 3 ) | 23. ( 2) | 24. ( 4 ) | 25. ( 3 ) | 26. ( 2 ) | 27. ( 2 ) | 28. ( 3 ) | 29. ( 3 ) | 30. ( 3 ) |
| 31. ( 2 ) | 32. ( 2 ) | 33. ( 2) | 34. ( 3 ) | 35. ( 2 ) | 36. ( 3 ) | 37. ( 2 ) | 38. ( 4 ) | 39. ( 4 ) | 40. ( 3 ) |

(ල. 40)

## II පත්‍රය

(01) (i) ධර්මදූත සේවයට සූදානම / ජෙරුසලමෙහි සාක්ෂි දැරීම / ජුදයේ සහ සමාරියේ සාක්ෂි දැරීම / ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත සේවය (10 වසර පිටුව 05)

(ii) 1543 ප්‍රැන්සිස්කන් ධර්මදූතවරු / 1602 ජේසු නිකායික ධර්මදූතවරු / 1605 දොමිනිකාන නිකායික ධර්මදූතවරු / 1606 අගුස්තීනු නිකායික ධර්මදූතවරු (10 වසර පිටුව 38)

(iii) පව්වලට වන්දි ගෙවීම සඳහා / දෙවියන් වහන්සේ සමඟ යහපත් හා අඛණ්ඩ සම්බන්ධතාවක් පවත්වා ගැනීම සඳහා (10 වසර පිටුව 55)

(iv) හයවන පනත කාමමිථ්‍යාචාරය නොකරව / නවවන පනත නුඹේ අසල්වැසියාගේ භාර්යාවට ඇළුම් නොකරව (10 වසර පිටුව 88)

(v) පඬුරු පෙරහැර හා පඬුරු පිදීම / පඬුරු මත යැදුම (10 වසර පිටුව 117)

(vi) දිළින්ඳන්ගේ සුභාරංචිය / අන්‍ය ජාතීන්ගේ සුභාරංචිය / දයාබේ සුභාරංචිය / යාච්ඤාවේ සුභාරංචිය / කාන්තාවන්ගේ සුභාරංචිය (11 වසර පිටුව 14)

(vii) අසංඛ්‍ය වූ දරු පරපුරක් ලබා දීම. / සදහටම හිමිවන දේශයක් ලබා දීම. (11 වසර පිටුව 35)

(viii) ඒකත්වය / අඛණ්ඩත්වය (11 වසර පිටුව 77)

(ix) වගා කිරීම / රැක බලා ගැනීම (11 වසර පිටුව 94)

(x) භාග්‍යවරයට එසවූයේ දෙවන ජුවාම් පාවුලු පාප්වහන්සේ / ශුද්ධවරයට එසවූයේ පළමුවන ප්‍රැන්සිස් පාප්වහන්සේ

(ලකුණු 02 × 10 = 20)

(02) (i) ගොබ් ඉරිදා / මහ බ්‍රහස්පතින්දා / මහ සිකුරාදා / ආලේලූයියා සෙනසුරාදා (10 වසර පිටුව 109) (ල.02)

(ii) තමන් වහන්සේ වෙනුවෙන් යාච්ඤා කිරීම / ශ්‍රාවකයින් වෙනුවෙන් යාච්ඤා කිරීම / අනාගත සභාවේ එකමුතුව වෙනුවෙන් යාච්ඤා කිරීම (10 වසර පිටුව 120, 121, 122) (ල.03)

(iii) ජනවන්දනා කමිටුවේ සියළු දෙනා රැස්කර ගනිමින් ජන වන්දනාව සූදානම් කිරීම / දිනයේ තේමාවට අනුව විශ්වාසකයින්ගේ යාච්ඤා ආදිය අර්ථවත්ව සකසා සූදානම් වීම / කියවීම් කියවන අය සරල චාම් ඇඳුමින් හෝ නියමිත ඇඳුමින් සැරසීමට දැනුවත් කිරීම / ගෞරවාන්විතව සුවිශේෂය වැඩමවීම / තේමාවයට අනුව ගීතිකා තෝරා ගැනීම හා පෙරහුරුව ආදී පිළිතුරු වලට ලකුණු පිරිනමන්න. (ල.05)

(03) (i) එම්මාවුස් ගමනේ දී ශ්‍රාවකයින් දෙදෙනෙකුට / තෝමස් අපෝස්තුළුවරයාට / මග්දලාවේ මරියාට (10 වසර පිටුව 21) (ල.02)

(ii) දේව වේද පුරාණය / වේද කාව්‍යය / පසන් පොත (10 වසර පිටුව 41) (ල.03)

(iii) අන්‍යාගමික පිළිවෙත් වැළඳ නොගැනීම / බරපතල ලෙස රෝගී වූ අවස්ථාවක යාච්ඤාව තුළ සුවය අත්දකීම / පාසලේදී මුහුණ දෙන අයුක්ති සහගත සිදුවීමකදී සාක්ෂි දැරීම / ආගමික අනන්‍යතාවයෙන් යුත් භක්ති අභ්‍යාස වලට ක්‍රියාකාරීව සහභාගී වීම / වැරදි අවබෝධයෙන් සිටින යහළුවෙකුට ක්‍රිස්තුන් වහන්සේ ගැන සත්‍ය තොරතුරු අවබෝධ කරදීම ආදී පිළිතුරු වලට ලකුණු ලබාදෙන්න. (ල.05)

(04) (i)
- ''මින් මතු ඔබ පොළෝ තලය මත සාප ලද්දෙක් වේවා!''
- ''පොළොවෙන් නුඹ නෙරපා දමනු ඇත.''
- ''මෙතැන්සිට නුඹ වගා කරන විට, එය නුඹට ඵලදාව නොදෙන්නේය.''
- ''නුඹ ගෙයක් දොරක් නැති මිහිපිට ඉබාගාතේ යන මිනිහෙක් වන්නෙහිය.'' (11 වසර පිටුව 24) (ල.02)

(ii)
- ''ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයානම්, මේ ගල් ගෙඩිය පාන් ගෙඩියක් වන්නට අණ කළ මැනව.''
- ''ඔබ මා ඉදිරියේ නමස්කාර කරන්නෙහි නම් (යක්ෂයා) මේ සියල්ල ඔබ සන්තක වන්නේය.''
- ''දේව මාලිගාවේ කොත මුදුනේ සිටවා ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මෙතනින් පහතට පනින්න.''

(11 වසර පිටුව 145) (ල.03)

(iii) දේව වචනයට අනුව දිවි ගෙවීම / ඉරුදින දිව්‍ය පූජාවේ දේශනය අනුව ජීවත් වීමට උත්සහ දැරීම / සරුපසේ පැළවූ බීජ මෙන් අප ජීවිත ආදර්ශමත්ව සකසා ගැනීම / දේව වචනයට ඇහුම්කන් දීම හා අවබෝධ කරගෙන ඒ අනුව ක්‍රියා කිරීම.. ආදී පිළිතුරු (ල.05)

(05) (i) කීකරුකම / පූජක බඹසර (11 වසර පිටුව 74) (ල.02)

(ii) ආරම්භක ප්‍රසාද නිධාන ලබා තිබිය යුතු ය. / අවුරුදු 16 ඉක්මවා ගිය අයෙකු විය යුතුය. / දරුවන්ගේ දෙමාපියන් විසින් අනුමත කරනු ලැබුවෙකු විය යුතුය. / ඔවුන්ට හිමි කාර්යයන් ඉටු කිරීමට කැමැත්ත හා හැකියාව තිබිය යුතුය. / දරුවාගේ දෙමාපියන් නොවිය යුතුය. (11 වසර පිටුව 60) (ල.03)

(iii) ක්‍රිස්තු වටිනාකම් තුළ ජීවිතය ගොඩනගා ගැනීම / දක්ෂතා හා කුසලතා වර්ධනය / සබකෝලය දුරලීම / ආකල්ප සංවර්ධනය / සැබෑ නායකත්වයට පුහුණු කිරීම ආදී පිළිතුරු... (ල.05)

(06) (i) ඉරුදිනත් ණය මංගල්‍ය දිනත් මුළු දිව්‍ය පූජා යාගයට සහභාගි වීම. / වසරකට වරක්වත් පාපොච්චාරණය කිරීම. / පාස්කු සමය තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීම. / නියම වූ දිනයන්හි ගොඩමස් වැළකීම සහ එක්වරු ශීල රැකීම. / ශුද්ධ වූ සභාවේ නඩත්තුව සඳහා ආධාර කිරීම. (11 වසර පිටුව 104) (ල.02)

(ii) පාතිමා නුවර දේව මාතාවන් දර්ශනය වීම / ලූර්දු නුවර දේව මාතාවන් දර්ශනය වීම / වේලක්කන්නි නුවර දේව මාතාවන් දර්ශනය වීම (11 වසර පිටුව 118, 119) (ල.03)

(iii) තමා කළ වරදට සමාව ඉල්ලීම / ඔවුන්ට වෛර නොකිරීම / අනුන්ගේ වැරදි වලට හදවතින්ම සමාව දීම / පාපොච්චාරණය මගින් ආත්ම සෝදිසියක නිරත වී නැවත වැරදි නොකරන්නට අධිෂ්ඨාන කිරීම ආදී පිළිතුරු සලකා බලා ලකුණු පිරිනමන්න. (ල.05)

(07) (i) ශුද්ධ බයිබලයේ සෙප්ටුවාජින්ත පිටපත (11 වසර පිටුව 06)

(ii) දයාවේ වසර තුළ අභිෂේක ලත් දයාවේ දූතිකාව (10 වසර පිටුව 59)

(iii) කතෝලික දහම්පාසල (11 වසර පිටුව 87)

(iv) අති උතුම් ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා (10 වසර පිටුව 32)

The National e-learning Portal for The General Education